**පාඨමාලා සංකේතය :** PALI E3025

**ඒකක වර්ගයඃ** C

**මාතෘකාව :**

පාලි පිටකාගත දර්ශනය, ආචාරධර්ම හා මූලාශ්‍රය අධ්‍යයනය

**අරමුණු හා අභිමතාර්ථඃ**

පාලි සූත්‍ර පිටකය ඇසුරෙන් බුදුදහමෙහි දාර්ශනික සංකල්ප හා විනය පිටකය ඇසුරෙන් බෞද්ධ ආචාරමාර්ගය පිළිබඳ දැනුමක් ලබාදීම ද විවිධ භාෂාවන්ගෙන් දක්නට ලැබෙන බෞද්ධ මූලාශ්‍රය සාහිත්‍යය පිළිබඳ හැඳින්වීමක් ලබාදීම ද මෙයින් අපේක්ෂිතය.

**ඉගෙනුම් ඵලඃ**

ඥානාත්මක සහ ආචාරාත්මක ජීවන චර්යාවකින් සුපෝෂිත වනු පිණිස පාලි සූත්‍ර සහ විනය පිටකාගත ඉගැන්වීම් යථායෝග්‍ය පරිදි හඳුනාගෙන විග්‍රහ කරන අතර විවිධ භාෂාවන්ගෙන් රචිත බෞද්ධ මූලාශ්‍රයන්ගේ ආශ්‍රය ආත්මාර්ථ සහ පරාර්ථ සාධනයෙහිලා යොදාගත හැකි අයුරු දක්වයි.

**අන්තර්ගතයඃ**

- **පාලි පිටාකාගත දර්ශනය**

සූත්‍ර පිටකාගත ත්‍රිලක්ෂණය, නාමරූප විභාගය, පටිච්ච සමුප්පාදය, චතුරාර්ය සත්‍යය, පුනර්භවය, කුසලාකුසල පිළිබඳ නිර්ණායක, කර්මය, ස්වච්ඡන්දතාව හා සීලය යනාදී සංකල්පයන්හි ආචාරාත්මක හා දාර්ශනික වැදගත්කම,

- **ආචාර ධර්ම**

පාරාජිකා, සංඝාදිසේස, පාචිත්තිය, අනියත, අධිකරණසමථ හා සේඛියා ආදී විනය ශික්ෂාවන් හා ඒවායේ පසුබිම පිළිබඳ විස්තරාත්මක අධ්‍යයනය, ආචරිය, උපජ්ඣාය, සද්ධිවිහාරික අන්තෙවාසික සබඳතා හා දඬුවම් ක්‍රම ඇසුරින් විනයෙහි එන පුද්ගල චරිත විශ්ලේෂණය,මානසික ගැටලු නිරාකරණය.විවිධ මානසික පසුතල හා මනෝවිද්‍යාත්මක ශික්ෂණ ක්‍රම පිළිබඳ අවබෝධය.

- **මූලාශ්‍රය අධ්‍යයනය**

සිංහල, පාලි, මිශ්‍ර සංස්කෘත, ඉංග්‍රිසි භාෂාවන්ගෙන් ලියැවුණු ග්‍රන්ථයන්හි එන බෞද්ධ සංකල්පයන් විවරණය වන ඡේද අධ්‍යයනය, එම ඡේදවල විෂය, භාෂාව, සාහිත්‍යමය අගය,කතෘත්වය හා කාලය ආදී කරුණු පිළිබඳ අධ්‍යයනය.

**ඉගෙනුම් ක්‍රමවේදය :** අත් පත්‍රිකා, අධ්‍යයන මාර්ගෝපදේශ හා සම්මන්ත්‍රණ

**ඇගයීම් ක්‍රමයඃ** වර්ෂාවසානයේ දී පැවැත්වෙන පැය 03ක ලිඛිත පරීක්ෂණය.

**නිර්දේශිත කියවීම්:**

කරුණාරත්න, ඩබ්.ඇස්. (1987).*බෞද්ධ දර්ශනය හා චරණය*.කොළඹ:ගොඩගේ.

ගල්මංගොඩ, සුමනපාල. (1994).*ආදී බෞද්ධ දර්ශනය (මූලධර්ම විග්‍රහයක්)*, කඩවත: අභය මුද්‍රණ ශිල්පියෝ සහ ප්‍රකාශකයෝ.

තෝමස්, ඊ.ජේ. (1966). (පරි.), කරුණා සේනානායක. *බෞද්ධ චින්තාවේ ඉතිහාසය.* කොළඹ: ගුණසේන සහ සමාගම.

බුද්ධදත්ත හිමි, පොල්වත්තේ. (1962).*ථෙරවාද බෞද්ධ දර්ශනය.* අම්බලන්ගොඩ: ආනන්ද පොත්හල.

මේධානන්ද හිමි, දේවාලේගම. (1994). *මුල් බුදුසමය හා සාමයික පසුබිම*, කැලණිය.

රාහුල හිමි, වල්පොල. (1965).*බුදුන් වදාළ ධර්මය.* කොළඹ: ගුණසේන සහ සමාගම.

ඤාණසීහ හිමි, හේන්පිටගෙදර. (1959). *ඛන්ධක විනය*, කොළඹ.

අබේනායක, ඔලිවර්. (2009). *පාලි අධ්‍යයන විමර්ශන*, බොරැල්ල: විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය.

අරියවිමල හිමි, කොස්වත්තේ. (සංස්.), පඤ්ඤාරතන හිමි, මහමිතව.*විවරණ.* සරසි, ගලෙන්බිඳුණුවැව.